සිටී. තෙත් කලාපයේ වනාන්තර තුළ සුලභව දැකිය හැකිය. වියළි කලාපයෙන් වාර්තා නොවේ.

කුඩා මූකලන් තෙලිස්සා උග්‍ර විෂැති සර්පයෙකි. බොහෝ විට සිරුර තද දුඹුරු පැහැවන අතර, මූලික ශරීර ලක්ෂණ පොලොං



කුඩා මූකලන් තෙලිස්සා (**Hypnale walli**) තෙත් කලාපයට සීමා වී ඇති උග්‍ර විෂැති සර්පයෙකි.

තෙලිස්සාටත්, මූකලන් තෙලිස්සාටත් සමානය. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ පැතිර ඇති අතර, වියළි කලාපයෙන් වාර්තා නොවේ.

පහත දැක්වෙන සර්පයින් තිදෙනා උග්‍ර විෂැති කරවලුන් අනුකරණය කරනු ඇත. බැලූ බැල්මටම මේ සර්පයින් කරවලුන් වැනි වුවද උන් නිර්විෂැතිය. මෙයින් අළු රදනකයා හා කබර රදනකයා නිවෙස් ආශ්‍රිතව නිතරම හමුවන අතර උන් සුලභව ඝාතනයට ලක්වේ.



අළු රදනකයා (**Lycodon aulicus**) නිර්විෂැතිය. නිවෙස් අසල සුලභව ගැවසේ



කබර රදනකයා (**Lycodon striatus**) නිර්විෂැතිය. නිවෙස් අසල සුලභව ගැවසේ



දාර කරවලා (**Cercaspis carinatus**) ශ්‍රී ලංකාවට ආවේණික නිර්විෂ සර්පයෙකි

ඉහත විස්තර කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ජීවත්වන උග්‍ර විෂැති හෙවත් මාරාන්තික විෂ සර්පයින්ය. මෙම කෙටි සටහනින් හා රූප මගින් ඔබට උන් හඳුනාගැනීමට අවශ්‍ය දත්ත හා තොරතුරු ලබා දී ඇත. මෙම සර්පයින් ඔබගේ නිවසෙ, ගෙවත්තේ, ගොවිබිමේ හෝ කොතැනකදී හමුවුවත් උන් නොමරා සුදුසු ස්ථානයකට මුදා හරින්න. මේ තොරතුරු ඔබ අතට පත් කරන ලද්දේ ඔබේ ආරක්ෂාවට මෙන්ම සර්පයින්ගේ ආරක්ෂාවටත් උන්ගේ සංරක්ෂණයටත් බව අමතක නොකරන්න.

*සටහන සම්පාදනය -*

කැළුම් මනමේන්ද්‍ර-ආරච්චි, වෛද්‍ය කලන මාදුවගේ,
වෛද්‍ය අංජන සිල්වා, ආචාර්ය මාධව මීගස්කුඹුර

*ඡායාරූප අනුග්‍රහය -*
රුවිර සෝමවීර

**ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය**
**පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය**



# උග්‍ර විෂ සර්පයන් හඳුනා ගැනීම

ශ්‍රී ලංකාවේ ගොඩබිම හා රට අවට මුහුදේ වාර්තාවන සියයක් පමණ වූ සර්පයින්ගෙන් උන්ගේ විෂ මගින් සෘජුවම හෝ වකුගඩුවලට දැඩි හානි සිදුකරමින් ද්විතියිකව සිදුවන අතුරු ආබාධ හේතුවෙන් හෝ මිනිස් ජීවිතවලට හානි සිදුකළ හැකි සර්පයින් ඇත්තේ අටදෙනෙකු පමණි.

මෙම විෂ සහිත සර්පයින් අටදෙනා මුහුදු මට්ටමේ සිට මීටර් 2,000 ක් පමණ වූ උස් කඳු මුදුන්වල හැරෙන්නට ශ්‍රී ලංකාවේ ඕනෑම පරිසරයක ජීවත් වේ. මේ හේතුවෙන් මෙම උග්‍ර විෂ සර්පයින් අපට එදිනෙදා ජීවිතයේ හමුවීමට ඇති අවස්ථා සුලභය.

මේ සර්පයින්ගෙන් බහුතරය නිවෙස් ආශ්‍රිතව ගැවසෙන බැවින් අප වඩාත්ම කල්පනාකාරී විය යුතුය. උන් නිසි ලෙස හඳුනාගැනීම, උන්ගේ චර්යාරටා තේරුම් ගැනීම ආදී දැනුවත්වීම් මගින් සර්ප දෂ්ඨන අවම කර ගත හැකිවීමේ අවස්ථාව අපට ඇත.

තෙල් කරවලා / ඉන්දියානු තෙල් කරවලා / මගමරුවා / හබරලා යනුවෙන් හැඳින්වෙන මෙම සර්පයා මෙරට වෙසෙන



තෙල් කරවලා (**Bungarus caeruleus**) වියළි තැනිතලා පෙදෙස්වල සුලභ වන අතර උග්‍ර විෂැතිය

උග්‍රතම විෂැති සර්පයෙකි. දීප්තිමත් කළු පැහැති සිරුරේ සුදු පැහැති සිහින් හරස් තීර පිහිටයි. ශරීරය මුදුනේ වූ කොරළ පෙළ ප්‍රමාණයෙන් විශාල අතර ෂඩාස්‍රාකාර හැඩැති ය. දිවා කාලයේ ඉතා අලසව කොළ රොඩු හා ගල් ගොඩවල් යට සැඟවී ජීවත්වන අතර දෂ්ඨ කිරීමට ද නොපෙළඹේ. නමුත් රාත්‍රී කාලයේ ඉතා ක්‍රියාශීලීය. ජලය ආශ්‍රිතව ගැවසීමට වැඩි කැමැත්තක් දක්වයි. අනුරාධපුරය, පොළොන්නරුව ඇතුළු ඒ ආශ්‍රිත වියළි කලාපයේ ඉතා සුලභය.

**මුදු කරවලා / හත් කරවලා / දුනු කරවලා** උග්‍ර විෂැති සර්පයෙකි. ශරීරය පෘෂ්ඨීයව තද දුඹුරු හෝ දීප්තිමත් කළු පැහැති වන අතර එහි සුදු පැහැති පළල් හරස් තීර පිහිටයි. ශරීරය මුදුනේ වන කොරළ පෙළ ප්‍රමාණයෙන් විශාල වන අතර, ෂඩාස්‍රාකාර හැඩැති ය.



මුදු කරවලා ***(Bungarus ceylonicus)*** තෙත් කලාපයේ වාසය කරන උග්‍ර විෂැති සර්පයෙකි

දිවා කල අලසව සැඟවිය හැකි ස්ථානයක ගත කරයි. දෂ්ඨ කිරීමට ද තැත් නොකරයි. නමුත් රාත්‍රී කල ක්‍රියාශීලීය. තෙත් හා සෙවනැති ස්ථානවල ගැවසේ. ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වාර්තා වන අතර, වියළි පෙදෙස්වලින් වාර්තා නොවේ.

**නයා / නාගයා** උග්‍ර විෂැති සර්පයෙකි. ශරීර වර්ණය කළු, දුඹුරු වුව ද වර්ණය බොහෝසේ වෙනස් වේ. සිහින් සුදු පැහැති හරස් තීර ශරීරයේ පිහිටයි. පෙනය නිසා නාගයා ඉතා පහසුවෙන් හඳුනාගත හැකිය. ප්‍රධාන වශයෙන් දිවාකල ක්‍රියාශීලී වුව ද රාත්‍රියේ ද සැරිසරනු ඇත. තරමක් දුරට ගස් නැගීමටත් පිහිනීමටත් හැකියාව ඇති අතර ජලය ආශ්‍රිතව ජීවත්වීමට වැඩි කැමැත්තක් දක්වයි. වේ හුඹස් හා මීයන් හාරන ලද ගුල්වල ද



නාගයා ***(Naja naja)***

ජීවත් වේ. නිවෙස් අසල සුලභව හමුවේ. උස් කඳුකරයේ හැර ශ්‍රී ලංකාවේ සැම කලාපයකම පාහේ ජීවත්වේ.

**තිත් පොළඟා / ආර පොළඟා** ශ්‍රී ලංකාවේ සුලභ උග්‍ර විෂැති සර්පයෙකි. කහ පැහැයට හුරු ලා දුඹුරු පැහැති ශරීරයේ දිගු



තිත් පොළඟා ***(Daboia russelii)*** තෙත් හා වියළි කලාප දෙකේම වාසය කරන උග්‍ර විෂැති සර්පයෙකි

අතට දිවෙන දම්වැලක ආකාරයට සැකසුණු පැහැදිලි පුල්ලි පේළි තුනක් ඇත. ගෙල සිහින්ය. හිස ත්‍රිකෝණාකාර හැඩැතිය. ප්‍රධාන වශයෙන් ම රාත්‍රී කාලයේ ක්‍රියාශීලී වුව ද දිවා කල ද සැරිසරනු ඇත. ප්‍රකෝප වූ විට දඟර ගසා පිඹිමින් දෂ්ඨනයට සැරසේ. නිවෙස් අසල සුලභව හමුවන අතර නිවෙස් තුළට ද පැමිණේ. උස් කඳුකරයේ හැරුණු විට ශ්‍රී ලංකාව පුරාම පැතිර ඇත.

**වැලි පොළඟා** උග්‍ර විෂැති ප්‍රමාණයෙන් කුඩා සර්පයෙකි. නමුත් ශ්‍රී ලංකාවෙන් දෂ්ඨන වාර්තා වී ඇතත් මරණ වාර්තා වී නොමැත.



වැලි පොළඟා ***(Ehis carinatus)*** උග්‍ර විෂැතිය, වියළි කලාපයේ වාසය කරයි

ශරීරය ලා දුඹුරු, අළු හා තද දුඹුරු පැහැයෙන් රටාගැන්වී ඇත. හිස මත කතිර සලකුණක් ඇත. සවස් හා රාත්‍රී කාලයේදී වඩාත්ම ක්‍රියාශීලීය. ඉතා ඉක්මනින් කිපෙනසුලු වැලි පොළඟාට තම ශරීරයේ කොරපොතු එකිනෙක ඇතිල්ලීමෙන් ශබ්දයක් පිට කළ හැකිය. බොහෝ විට සපාකෑමට පෙළඹේ. උතුරු, වයඹ, නැගෙනහිර සහ ගිනිකොනදිග පෙදෙස්වල වාසය කරයි. දිවා කල කොළ රොඩු අතර සැඟවී ජීවත් වේ.

**පොළොං තෙලිස්සා / කුණකටුවා / ගැට පොළඟා** උග්‍ර විෂැති සර්පයෙකි. ශරීරය අළු, දුඹුරු හෝ තැඹිලි පැහැයේ සිට වෙනස් වන වර්ණයන්ගෙන් යුක්තය. එහි තද දුඹුරු පැහැ පුල්ලි පිහිටයි. ගෙල සිහින්ය. හිස ත්‍රිකෝණාකාර හැඩැතිය. රාත්‍රී මෙන්ම දිවා කල ද හැසිරීම් පෙන්වයි. කොළ රොඩු, දර ගොඩවල් හා දිරා



පොළොං තෙලිස්සා ***(Hypnale hypnale)*** තෙත් හා වියළි කලාප දෙකේම වාසය කරයි. උග්‍ර විෂැතිය

යන කොටන් අතර දරණ ගසා සිටී. නිවෙස් අසල පහසුවෙන් හමුවේ. කඳුකරයේ හැර ශ්‍රී ලංකාව පුරාම පැතිර ජීවත්වේ.

**මූකලන් තෙලිස්සා** උග්‍ර විෂැති සර්පයෙකි. මූලික ශරීර ලක්ෂණ පොළොං තෙලිස්සාට සමානය. දිවා කල මෙන්ම රාත්‍රියේද සැරිසරයි. රාත්‍රී කල කුඩා පඳුරු මතට නගින අවස්ථා ඇත. කොළරොඩු, දර ගොඩවල් හා විශාල ගස් මුල් අතර දරණ ගසා



මූකලන් තෙලිස්සා ***(Hypnale nepa)*** උග්‍ර විෂැතිය. තෙත් කලාපයට පමණක් සීමාවී ඇත.